# බෝගවලට පොහොර යොදමු මෙලෙස

**මතුගම රත්නසිරි හේවාවසම් විසිනි**

අද ගොවිතැන් සඳහා රසාය නික පොහොර යෙදීම බෙහෙවින් වැඩිය. මෙයට හේතු කිහිපයක් ඇත. එම පොහොර පහසුවෙන් ලබා ගැනීමටත්, බෝග ඌනතාවය අනුව වෙන් වශයෙන් යෙදීමටත්, තැන් තැන්වලට පහසුවෙන් ගෙන යාමටත්, ඉක්මණින් වැඩි අස්වනු ලබාගැනීමටත් යන හේතුය.

බෝග වලට රසායනික පො හොර යොදන විට මේ කරුණු අනු ගමනයෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකිය.

වර්ෂාව අඩු වශයෙන් හෝ නිය හය වැඩිපුර නැති කාලයක මේ පොහොර යෙදීමෙන් ඒවා අපතේ යෑම වලක්වා ගත හැකිය. තවද පොහොර එකවර යොදනවාට වඩා කලින් කලට ස්වල්ප ප්‍රමාණය බැගින් යෙදිය යුතුය. කොළවල තෙත් ගතිය නැතිවිට මෙන්ම අවශ්‍ය පමණට වඩා නොයෙදී මෙන් බෝග වලට වන හානි මහ හරවා ගත හැකිය.

බෝග වලට රසායනික පො හොර යෙදීමේ විද්‍යාත්මක ක්‍රම මෙසේය.

1. පසට ඉසීම: පැල සිටුවීමට, වගා කරන විට මෙහි පො හොර ඉසීම මැනවි. වී වගා වට මේ පොහොර යෙදීමේ ක්‍රමය පහසු හා ඵලදායකය. එහෙත් පැල අතර පරතරය වැඩිවූ බෝග වලට මේ ක්‍රමය සුදුසු නොවේ.

2. අවට යෙදීම: ශාක වලට අවශ්‍ය පමණ ලබා ගැනීම සඳහා පොහොර ශාක වලට ආසන්න වන සේ යෙදිය යුතුය.

3. වැටියට හා ජේලියට යෙදීම: ඉරිඟු වැනි ජේලියට සිටුවා ඇති බෝග වලට පොහොර යෙදීම සඳහා ඉහත සඳහන් ක්‍රමය අනුගමනය කරනු ලැබේ. වැටි ක්‍රමයට පො හොර යොදනවා නම් එක පැත්තකට හෝ දෙපැත්තකට යෙදීම හොඳය.

4. වප්කරයෙන් යෙදීම: කුඩා ඇට හා ධාන්‍ය වර්ග සිටු වන විට මේ ක්‍රමය සුදුසුය. පොහොර හා ඇට වර්ග මිශ්‍ර කොට සකස් කළ බීමෙහි යෝග්‍යය දුර ප්‍රමාණයකට වප් කරයෙන් යෙදිය යුතුය.

5. නගුල් තලයෙන් යෙදීම: මෙය සුදුසු වන්නේ වියළි ප්‍රදේශයටය. ප්‍රථමයෙන් සී සාන විට හීපාර දිගේ පො හොර දමා දෙවන හී පාරට වැසී යයි. මින්පසු පැළ සිටු විය හැකිය.

6. මතුපිට හෙවත් උඩින් පො හොර යෙදීම: වගා කළ බෝග වටා ඇති පස මතුපිටට යෙදීම මේ ක්‍රමයයි.

7. පණගන්නවන දියර: රසායන පොහොර ස්වල්පයක් ජලයට දියකොට ගලවා සිටවූ බෝග වලට යෙදීමෙන් පැලවල මුල් මගින් අවශෝෂනය කරගැනී මේ දියර වශයෙන් වැඩිපුර යොදන්නේ නම් රසායනික පොහොරය.

8. කොළවලට ඉසීම: බෝග වලට අවශ්‍ය මූල ද්‍රව්‍යයක් හිඟව දුර්වලව ඇති විට හැකි ඉක්මනින් එම මූල ද්‍රව්‍ය අඩංගු රසායනික පොහොර දියරයක් කොළවලට ඉසීම කරනු ලැබේ. උදාහරණ තේ පඳුරුවලට සින්ක් (තුත් තන ගම්) හිඟ වූ විට ලබා දෙන් නේ මෙම ක්‍රමයටයි.